# 08 දිවි මඟ සරු කරන සීලය

සසර දුක් සහිත ය. උපතත් සමග ඇතිවන ලෙඩ වීම, මහලු වීම, මරණය ආදී අප්‍රසන්න කටුක අත්දැකීම්වලින් යුක්ත ය. එකී සසර දුකින් අත්මිදීමේ මඟ බුදු දහමේ දැක්වේ. සංසාර ගත ජීවිතය තුළ වුව ද නිරවුල් ව ප්‍රීතිමත් ව නිරෝගී ව හා සාමකාමී ව ක්‍රියා කරන්නට අවශ්‍ය මාර්ගෝපදේශනය බුදු දහමේ ඇතුළත් වේ. සැපවත් ව ජීවත් වීමටත් සසර දුකින් අත්මිදීමටත් උපකාර වන මාර්ගය බුදුරජාණන් වහන්සේ විසින් වදාළ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එය දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය නම් වේ.

අංග අටකින් සමන්විත ආර්ය මාර්ගය හෙවත් නිවන් මඟ සීල, සමාධි හා ප්‍රඥා වශයෙන් ශික්ෂා තුනකට බෙදා දක්වා ඇත. මෙය ත්‍රිශික්ෂාව ලෙස ද හැඳින්වේ. අප මෙහි දී අවධානය යොමු කරනු ලබන්නේ සීල ශික්ෂාව පිළිබඳවයි. එය දෙයාකාරය. එනම්, විරමනය හෙවත් නොකළ යුත්ත නොකිරීම හා සමාදානය හෙවත් කළ යුත්ත කිරීම යනුවෙනි. එම සීල ශික්ෂාවට සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව යන අංග තුන ඇතුළත් ය. සම්මා වාචා යනු යහපත් වචන කතා කිරීමයි. එය සතරාකාර ය.

1. බොරු කීමෙන් වැළකීම
2. කේළාම් කීමෙන් වැළකීම
3. පරුෂ වචන කථා කිරීමෙන් වැළකීම
4. හිස් වචන කීමෙන් වැළකීම

ඉහත දක්වන ලද්දේ වචනයෙන් සිදු වන අකුසල්වලින් වැළකීම ය. බොරුවෙන් අනුන් රැවටීම නොකළ යුත්තයි. කළ යුත්ත නම් සත්‍යය කතා කිරීමයි. කේළාම් කීම නම් නොකළ යුත්තයි. ඉන් වැළකී සමගිය, සමාදානය, ඇති කරන වචන කථා කිරීම කළ යුත්තයි. අන්‍යයන්ගේ සිත් පීඩාවට පත් කරන නොසරුප් වදන් කීම නොකළ යුත්තයි. එය බැහැර කොට ප්‍රියශීලී වචන කථා කිරීම කළ යුත්තයි. නිසරු නිශ්ඵල වචන කතා කිරීම නොකළ යුත්තයි. ඵලදායී වූ යහපත් වචන කතාකිරීම කළ යුත්තයි.

මෙසේ වැරැදි අනර්ථවත් වචන භාවිතයෙන් වැළකී, නිවැරැදි ව, අර්ථවත් වචන භාවිත කරන තැනැත්තා සිය ජීවිතයේ දී සැමගේ විශ්වාසය හා ගෞරවය දිනා ගන්නෙක් වෙයි.

සීල ශික්ෂාවෙහි ඇතුළත් දෙවැනි කරුණ සම්මා කම්මන්තයයි. එනම් යහපත් වූ ක්‍රියාවන්හි නිරත වීමයි. තව දුරටත් පැහැදිලි කරන්නේ නම් සම්මා කම්මන්තයෙන් අපේක්ෂා කෙරෙන්නේ කයෙන් සිදු වන අකුසලවලින් ඉවත් ව කටයුතු කිරීම ය. සම්මා කම්මන්තයට අයත් අංග වන්නේ,

1. ප්‍රාණීන් මැරීමෙන් වැළකීම
2. සොරකම් කිරීමෙන් වැළකීම
3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම

සත්ත්ව ඝාතනයෙන් හෙවත් ප්‍රාණීන් මැරීමෙන් වැළකීම දුරු කළ යුතු නිසයි, පන්සිල් අටසිල් ආදී සියලු ම ශික්ෂා පදවලට එය ඇතුළත් ව පවතින්නේ. සතුන් මැරීමෙන් වැළකීම පමණක් නොව සතුන්ට අභය දානය දීම, ඔවුන්ට හිංසා පීඩා නොකිරීම ආදිය ද පුරුදු පුහුණු කළ යුතු ය. සියලු ම ප්‍රාණීන්ට කරුණාව, මෛත්‍රිය දැක්විය යුතු ය. එවිට ඔබ සියලු ජීවීන්ගේ ආරක්ෂකයා ද මිත්‍රයා ද වනු ඇත.

අන් සතු නුදුන් දේ තමන් සතු කර ගැනීමෙන්, උදුරා ගැනීමෙන්, පැහැර ගැනීමෙන් හෙවත් හොරකමින් වැළකී අන් සතු සම්පත් තමාගේ මෙන් සලකා රැක ගැනීම යහපත් වූ පුරුද්දකි. පෞද්ගලික දේපළ මෙන් ම පොදු දේපළ ද සුරැකීමේ ඇති වැදගත්කම මෙයින් වඩාත් තහවුරු වේ. වැරැදි කාම සේවනයෙන් වැළකීම යහපත් සමාජයක් පවත්වා ගැනීමට උපකාරවත් වේ. ශිෂ්‍ය ජීවිතයේ දී කුමර කුමරි බඹසර රැකගෙන කටයුතු කරන්නට ද අප වග බලා ගත යුතු ය. එය අනාගත යහපතට ද හේතු වේ.

සීල ශික්ෂාවේ තෙවන අංගය සම්මා ආජීවයයි. එනම් යහපත් දිවි පැවැත්මයි. සම්මා ආජීව හා මිච්ඡා ආජීව යැයි ජීවන ක්‍රම දෙකකි. අධාර්මික වූත් අකුසල සහගත වූත් ජීවිකා වෘත්තියක නිරත වීම මිච්ඡා ආජීවයයි. මිච්ඡා ආජීවයෙන් බැහැර ව සම්මා ආජීවයෙන් ජීවත් විය යුතු ය.

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන මෙකී සීල ශික්ෂාවේ යෙදීමෙන් අපේ පෞද්ගලික ජීවිතය වඩාත් ඵලදායක කර ගත හැකි අතර අපේ සමාජගත

ජීවිතය ද සාර්ථක වෙයි. තමා චරිතවත් ව සංවරශීලී පුද්ගලයකු ලෙස කටයුතු කරමින්, අනුන්ට හානියක් නොකොට, ඔවුන්ට ආදර්ශයක් වන පරිදි ක්‍රියා කිරීමට සිල්වත් තැනැත්තා සමත් වන්නේ ය. සම්මා ආජීවයෙන් යුතු ව ජීවත් වීමේ දී අනුගමනය කළ යුතු නිවැරැදි ජීවන ක්‍රම කිහිපයක් බුදු දහමෙන් පෙන්වා දී ඇත. ගොවිතැන් කිරීම, ගවයන් රැක බලා ගැනීම, රාජ්‍ය සේවය හා වෙළෙඳාම ඒ අතර වැදගත් වේ. මෙම රැකියාවන්හි නිවැරැදි ව දැහැමි ව යෙදීම බුදු දහම අවධාරණය කරයි. ගොවිතැන් කිරීමේ දී පරිසර හිතකාමී ව එම කටයුතු සිදු කළ යුතු ය. ගවයන් ඇති කිරීමේ දී සත්ත්ව කරුණාව පෙරටු කර ගත යුතු ය. රජයේ සේවය පොදු ජන සේවයක් ලෙස සාධාරණ ව ඉටු කළ යුතු ය. වෙළෙඳාමේ දී වංචනික ක්‍රියා බැහැර කොට, ලාභය ම අරමුණු නොකර ක්‍රියා කළ යුතු ය.

සිල්වත් ව කටයුතු කිරීමේ ආනිසංස පහක් ගැන ද දහමෙහි සඳහන් වේ.

1. මහත් වූ භෝග සම්පත් ලැබීම
2. කීර්තිය පැතිරීම
3. පිරිස් මැද නොබිය ව කටයුතු කිරීමට හැකිවීම
4. මරණයට බිය නොමැති වීම
5. මරණින් මතු සුගතියේ ඉපදීම

සීලය යනු කය වචන දෙකෙහි සංවර භාවයයි. එහි දී අදහස් කෙරෙනුයේ කයෙන් සිදු වන වැරැදි තුනෙන් වැළකීම හා වචනයෙන් සිදු වන වැරැදි හතරෙන් වැළකීම වේ.

## සාරාංශය

සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව යන අංග තුන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් වේ.

1. කය හා වචනයේ සංවර බව සීලයයි.
2. විරමනය හා සමාදානය යනුවෙන් සීලයේ දෙපැත්තක් ඇත.
3. සීලයේ ආනිසංස පහක් දහමෙහි දක්වා තිබේ.

## ක්‍රියාකාරකම



1. ශීල ශික්ෂාවට අයත් මාර්ගාංග නම් කරන්න.
2. සම්මා වාචා පැහැදිලි කරන්න.
3. සම්මා කම්මන්ත විස්තර කරන්න.

## පැවරුම



සීල ශික්ෂාව පිළිබඳ ව ඊ සටහනකින් දක්වන සැලසුමක් සකස් කරන්න.

## පුහුණුවට



කායේන සංවරෝ සාධු
සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු
සාධු සබ්බත්ථ සංවරෝ

කය සංවර කර ගැනීම මැනැවි. වචනය සංවර කරගැනීම මැනැවි. මනස සංවර කරගැනීම මැනැවි. තිදොර ම සංවර කර ගැනීම මැනැවි.